# සිංහල-දෙමළ බසින් රාජ්‍ය තොරතුරු හිඟ ඇයි?

තොරතුරු හා ප්‍රජාතන්ත්‍රවාදය අතර පවතිනුයේ දැඩි සැබැඳියාවකි. රටේ සිදුවන කවරම හෝ දෙයක් පිළිබඳව අපට යම් තොරතුරක් තහවුරු කර ගැනීමට නම් දත්ත අවශ්‍යය වේ. දත්ත නොමැතිව සිදුකරන කවරම හෝ ප්‍රකාශයක් භාර ගැනීම නුවණට හුරු ක්‍රියාවක් නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තුළ ජනතාව රටේ පවතින තත්ත්වය පිළිබඳව දැන ගැනීමට අයිතියක් පවතී. රාජ්‍ය යාන්ත්‍රණයේ තොරතුරු හා දත්ත භාවිතය සඳහා ජනතාවගේ ප්‍රවේශය සහ සහභාගිත්වය කවරාකාරද යන්න මෙන්න ඒ සඳහා ඔවුනට තම මාතෘ භාෂාවෙන්ම තොරතුරු දැනගැනීමට ඇති අයිතිය සැබෑ ලෙසම තහවුරුවී ඇතිද යන්න අදටත් ප්‍රශ්නයකි. මෙය වඩාත් බරපතළ වන්නේ ජාතියේ ප්‍රධාන දත්ත මධ්‍යස්ථානයක් ලෙසින් ක්‍රියාකරන ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සියලුම ලේඛන රාජ්‍ය භාෂා වන සිංහල හා දෙමළ බසින් ලබාදීමට අපොහොසත් වීමය. මේ නිසා සන්ධාන භාෂාව වූ ඉංග්‍රීසි නොදත් පුරවැසියා එම ලේඛන පරිශීලනයේදී වැටෙන්නේ දැඩි දුෂ්කරතාවකටය.

"ඇත්තටම වෙලා තියෙන්නේ අපිට ඒ භාෂා තුනෙන්ම හදන්න භාෂා පරිවර්තකයන් නැති ගැටලුව තමයි. අපි ඉංග්‍රීසියෙන් හැදුවොත් අපිට ඉංග්‍රීසි වාර්තාව ප්‍රකාශයට පත් කරන්න පුළුවන්. නමුත් අපිට ඒක සිංහලට විතරක් පරිවර්තනය කරන්න බැහැ. එහෙම වුණොත් සිංහල සහ දෙමළ වාර්තා දෙකම නිකුත් කරන්න ඕනනේ. අපි සම්පූර්ණ වාර්තාව නිකුත් කරන්න බැරි අවස්ථාවලදී භාෂා තුනෙන්ම මාධ්‍ය නිවේදන ලබා දෙනවා"


ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය සිය ආයතනය මුහුණපා ඇති ගැටලුව පැහැදිලි කළේ එසේය. මේ දත්ත එකතු කිරීමට මෙන්ම ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන්නට ද මුදල් අවශ්‍යය. ඒ සඳහා මුදල් වෙන්කරන්නේ මහජන බදු මුදලෙනි. ඉතින් ඒ සඳහා බදු ගෙවන ජනයාට මේ තොරතුරු කියවා ගැනීමට නොහැකි නම් ඇති ඵලය කුමක්ද?

## "පරිවර්තකයන් නෑ"

**ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න**

"හැම භාෂා පරිවර්තකයාටම අපේ දේවල් පරිවර්තනය කරන්න බැහැ. ඊට සුවිශේෂී වූ දැනුමක් අවශ්‍යයි. නිලධාරී හිඟය ඒකටත් බලපානවා. සංඛ්‍යා නිබන්ධනය වගේ ඒවා භාෂා තුනෙන්ම තියෙනවා. විශේෂිත සමීක්ෂණ, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය වාර්තා වගේ විශාල පොත් තමයි පරිවර්තනය කරන්න ගැටලුවකට මුහුණ දීලා ඉන්නේ. සංගණනයකදී පොඩි වාර්තා සිංහල මාධ්‍යයෙන් හදලා තියන්න

> තොරතුරු යනු නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යයකි. එහෙත් ඒ තොරතුරු පරිශීලනය කළ නොහැකි පරිදි ගබඩා කර තිබේ නම් ඉන් පලක් නැත. එය තොරතුරු අපේක්ෂා කරන මහජනයා ආතතියට පත් කරන තත්ත්වයකි.



අනෝජා සෙනෙවිරත්න




ෂාමින්ද මහලේකම්

පින්තූරයට වැඩිය බොහොම කටුක විදිහට තමයි අපිට මේක කරන්න වෙන්නේ."

තම මවු බසින් රාජ්‍ය තොරතුරු දැනගැනීමට ඇති හැකියාව පුරවැසි අයිතියකි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වැනි ආයතන පිහිටුවා ඇත්තේ ද ඒ සඳහාය. සහජීවනයෙන් පිරිපුන් සාමකාමී ත්‍රෛභාෂික සමාජයක් යන්න රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දැක්මයි. ඉතින් මේ ආයතන අතර සහසම්බන්ධයෙන් මෙවැනි ගැටලු විසඳාගත නොහැකිද? ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ඊට දුන්නේ මෙවැනි පිළිතුරකි.

"රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පරිවර්තකයෝ ඉන්නවා. ඒත් අපිට තියෙන්නේ



රාජ්‍ය භාෂා නිල වෙබ් අඩවිය උත්සවාකාරයෙන් එළිදැක්වූ දා

ප්‍රමාණයකට හරි ඉන්නවා. අපේ රටේ රාජ්‍ය භාෂාව සිංහලයි, දෙමළයිනේ. එතකොට සිංහල දෙමළ පරිවර්තකයෝ නැති ප්‍රශ්න තියෙනවා "

## "අධ්‍යාපන ක්‍රමයේ ප්‍රශ්නයක්".

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ රාජ්‍ය භාෂා කොමසාරිස් ෂාමින්ද මහලේකම්**

ෂාමින්ද මහලේකම් මහතා අවධාරණය කළේ මේ ගැටලුවට අධ්‍යාපන ක්‍රමයේ අර්බුදයද බලපා ඇති බවයි.

"සිංහල කෙනෙක් සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නවනේ. දෙමළ ඉගෙන ගන්න එක්කෙනකුත් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නවා. දෙමළ කෙනෙක් සිංහල භාෂාව ඉගෙන ගන්නේ නෑනේ. සිංහල කෙනකුත් දෙමළ භාෂාව දෙවන භාෂාව විදිහට නවය වසරට වෙනකම් විතරයි කරන්නේ. එතැනින් එහාට ඉගෙනගෙන නැහැනේ. එතකොට අර සිංහල දෙමළ පරිවර්තකයෝ සමහරක් වෙලාවට එයා ජීවත් වෙන පරිසරය අනුව බිහි වුණොත් හැරෙන්න ඇත්තටම අධ්‍යාපන ක්‍රමය ඇතුළේ එයාට බිහි වෙන්න විදිහක් නැහැනේ. එක හේතුවක් තමයි දැන් විශ්වවිද්‍යාලවල භාෂා පරිවර්තන විශේෂතා උපාධි පටන් ගත්තා. නමුත් සිංහලෙන් දෙමළ බසට කරන පරිවර්තනය කරන එකට උපාධියක් නැහැ. ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලටයි දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසියටයි තමයි තියෙන්නේ.

අවධානයක් දී නැතත් එයින් දිනපතාම පීඩා විඳීමට සාමාන්‍ය වැසියාට සිදුව තිබේ. එකම වෙනස වන්නේ ඔවුන් ඒ සියල්ල නිහඬව විඳ දරාගැනීමය. භාෂාව භාවිතය අයිතියක් බව දන්නා පුරවැසියෝ සිය අයිතිය ඉල්ලා සටන් කරති. විදුලි ගාස්තු සංශෝධනයේදී මහජන උපදේශනයට නොපැමිණි ලංකා විදුලි බල මණ්ඩල නිලධාරීන් ඉංග්‍රීසි බසින් හඬපට එවා අත පිසදාගැනීම ඊට ආසන්න නිදසුනකි. විදුලිය පාවිච්චි කරන්නන්ගේ සංගමය මේ ගැන සිය දැඩි විරෝධය පළ කර තිබිණි.

"අපේ ජාතික භාෂාව සිංහල. අපේ ගම්වල මිනිස්සු වැඩියෙන් භාවිත කරන්නේ සිංහල හා දමිළ භාෂාව. විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් මේක නොදැන ඉන්න විදිහක් නෑනේ. මේකෙ ඇත්ත කතාව භාෂාව නෙවෙයි. ලංවීම කලින් ඉදිරිපත් කළ දත්ත වැරැදියි. ඒ දත්ත දෝෂය වහගන්න තමයි ඉංග්‍රීසියෙන් හඬපට එවලා නිලධාරීන් හැංගුණේ."

විදුලිය පාවිච්චි කරන්නන්ගේ සංගමයේ ජාතික ලේකම් සංජීව ධම්මික මහතා කරන චෝදනාව අනුව රාජ්‍ය නිලධාරීන් මේ කරන්නේ මිනිසුන්ගේ මූලික අයිතිය වට දෙකකින් උදුරා ගැනීමකි. බොරු දත්ත නිසා හැංගිමුත්තන් කරමින් පාරිභෝගිකයාට කොකා පෙන්වන නිලධාරීන් ගැන උපයෝගිතා කොමිසම දැඩි

බලවාගැනීම්වලදී වසරක භාෂා පුහුණුවක් ලබාදෙන ලෙස රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව කැබිනට්ටුවෙන් ඉල්ලීමක් කර ඇති බවයි. කෙසේවෙතත් ඔහු පෙන්වා දෙන තවත් පැතිකඩක් වන්නේ පරිවර්තනය ජීවන වෘත්තියක් හැටියට ගත්කල ඇති වැටුප් ප්‍රශ්නයයි.

"තව පැත්තක් තියෙනවා. භාෂා පරිවර්තකයන්ට ගෙවන වැටුපෙත් පොඩි ගැටලුවක් තියෙනවා. ගොඩක් වෙලාවට භාෂා පරිවර්තනය දන්න කට්ටියත් වෘත්තිය අතහැරලා යනවා. එයාලගේ භාෂා දැනුමට සරිලන විදිහට වැටුපක් නොලැබුණාම එයාලා භාෂා පරිවර්තනයට එන්නේ නැහැ. ඒ අය වෙන රක්ෂාවක් හොයාගන්නවා."

## ලංවීම වැරැද්ද ඉංග්‍රීසියෙන් හංගයි

භාෂා පරිවර්තනයේ ගැටලුවට රජය ලොකු

මහජන බදු මුදලෙනි. ඉතින් ඒ සඳහා බදු ගෙවන ජනයාට මේ තොරතුරු කියවා ගැනීමට නොහැකි නම් ඇති ඵලය කුමක්ද?

"පරිවර්තකයන් නෑ"

**ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න**

"හැම භාෂා පරිවර්තකයාටම අපේ දේවල් පරිවර්තනය කරන්න බැහැ. ඊට සුවිශේෂී වූ දැනුමක් අවශ්‍යයි. නිලධාරි හිඟය ඒකටත් බලපානවා. සංඛ්‍යා නිබන්ධනය වගේ ඒවා භාෂා තුනෙන්ම තියෙනවා. විශේෂිත සමීක්ෂණ, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය වාර්තා වගේ විශාල පොත් තමයි පරිවර්තනය කරන්න ගැටලුවකට මුහුණ දීලා ඉන්නේ. සංගණනයකදී ... වාර්තා සිංහල මාධ්‍යයෙන් හදලා තියෙන ... එක මම හැමදාම කියනවා තියෙනවා. තාක්ෂණික වාර්තාව අපිට එකාන්ම ලේසි ඉංග්‍රීසියෙන් කරන්න. අපි ඒක නියමිත දිනට නිකුත් කරනවා. ඒ වාර්තා පදනම් කරගෙන අපි සිංහලට සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කරවීම කරනවා."

"අපි සිංහල වාර්තාව මුලින්ම හැදුවොත් ඒක ඉංග්‍රීසියට පරිවර්තනය කරන්නෙ නැතුව දෙමළ වලට දෙන්න විදිහක් නැහැ. සිංහල කොපිය දෙමළට පරිවර්තනය කරන අය දැන් නැහැ. ඉන්න කට්ටිය ඉතාමත් අඩුයි. ඒ කියන්නේ සිංහලෙන් තියෙන දෙයක් දෙමළවලට සෘජුවම පරිවර්තනය කරන්න පුළුවන් අය දැන් රජයේ සේවයේ අඩු වෙලා.

සිංහල එකක් දෙමළවලට පරිවර්තනය කරන්න දෙනවා නම් අපි මුලින්ම ඉංග්‍රීසියට පරිවර්තනය කරලා ඊට පස්සේ තමයි දෙමළ වලට දෙන්න වෙන්නේ. වැඩිම ලේසිය අපිට ඉංග්‍රීසි එක හදන එකනේ. ඒක තමයි සාමාන්‍යයෙන් වෙන්නේ. මේක ඇවිල්ල අපිට තියෙන ප්‍රායෝගික ගැටලුව. එළියේ ඉඳන් බලන පින්තූරයට වැඩිය බොහොම කටුක විදිහට තමයි අපිට මේක කරන්න වෙන්නේ."

තම මවු බසින් රාජ්‍ය තොරතුරු දැනගැනීමට ඇති හැකියාව පුරවැසි අයිතියකි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වැනි ආයතන පිහිටුවා ඇත්තේ ද ඒ සඳහාය. සහජීවනයෙන් පිරිපුන් සාමකාමී ත්‍රෛභාෂික සමාජයක් යන්න රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දැක්මයි. ඉතින් මේ ආයතන අතර සහසම්බන්ධයෙන් මෙවැනි ගැටලු විසඳාගත නොහැකිද? ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ඊට දුන්නේ මෙවැනි පිළිතුරකි.

"රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පරිවර්තකයෝ ඉන්නවා. ඒත් අපිට තියෙන්නේ තාක්ෂණික වාර්තා. විශේෂයෙන් සමීක්ෂණවලදී ඒ වාර්තාවල තියෙන තාක්ෂණික තොරතුරු පරිවර්තනය කරනකොට වචන නිවැරැදි තාක්ෂණික වචනය යෙදුවේ නැත්නම් තව කෙනෙක්ට ඒක නිවැරැදි කරන්න ලොකු උත්සාහයක් ගන්න වෙනවා."

කෙසේ වෙතත් මේ ගැන කළ විමසීමේදී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ රාජ්‍ය භාෂා කොමසාරිස් (පරිවර්තන) ෂාමින්ද මහලේකම් මහතාගේ පිළිතුර වූයේ ද පරිවර්තකයන්ගේ ගැටලුවට එම ආයතනය ද මුහුණ දී ඇති බවයි.


ෂාමින්ද මහලේකම්


සංජීව ධම්මික

"භාෂා පරිවර්තකයන්ගේ හිඟය කියන එක ඇත්තටම තියෙනවා. රජයේ අනුමත තනතුරුවල 650කට කිට්ටු වෙන්න පුරප්පාඩු තියෙනවා. ඒකෙ ගොඩාක්ම ප්‍රශ්න තියෙන්නේ සිංහල, දෙමළ කට්ටියගේ. සිංහලෙන් දෙමළටයි දෙමළෙන් සිංහලටයි පරිවර්තනය කරන එක. ඒ කියන්නේ සිංහල දෙමළ පරිවර්තකයන් තමයි දැඩි හිඟයක් තියෙන්නේ. ඉංග්‍රීසි සිංහලයි, දෙමළ ඉංග්‍රීසි පරිවර්තකයෝ සාමාන්‍ය බලපා ඇති බවයි.

"සිංහල කෙනෙක් සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නවනේ. දෙමළ ඉගෙන ගන්න එක්කෙනකුත් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නවා. දෙමළ කෙනෙක් සිංහල භාෂාව ඉගෙන ගන්නේ නෑනේ. සිංහල කෙනකුත් දෙමළ භාෂාව දෙවන භාෂාව විදිහට නවය වසරට වෙනකම් විතරයි කරන්නේ. එතැනින් එහාට ඉගෙනගෙන නැහැනේ. එතකොට අර සිංහල දෙමළ පරිවර්තකයෝ සමහරක් වෙලාවට එයා ජීවත් වෙන පරිසරය අනුව බිහි වුණොත් හැරෙන්න ඇත්තටම අධ්‍යාපන ක්‍රමය ඇතුළේ එයාට බිහි වෙන්න විදිහක් නැහැනේ. එක හේතුවක් තමයි දැන් විශ්වවිද්‍යාලවල භාෂා පරිවර්තන විශේෂතා උපාධි පටන් ගත්තා. නමුත් සිංහලෙන් දෙමළ බසට කරන පරිවර්තනය කරන එකට උපාධියක් නැහැ. ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලටයි දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසියටයි තමයි තියෙන්නේ. දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට එකතු වෙලා තියෙනවා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයේ. කැලණි-සබරගමුවේ සිංහලෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තන උපාධි තියෙනවා. සිංහල, දෙමළ භාෂා පරිවර්තක ගැටලුව විසඳන්න නම් විශ්වවිද්‍යාල මට්ටමෙනුත් උපාධි පාඨමාලාවක් පටන් ගන්න ඕනෑ. ඒක මං හිතන්නේ දැන් අමාත්‍ය මණ්ඩලයට ගිහිල්ලා. ඒ කට්ටියගේ නිර්දේශයකුත් දීලා තියෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට ඉක්මනට පටන් ගන්න කියලා. මං හිතන්නේ යාපනය විශ්වවිද්‍යාලයේ ළඟදී පටන්ගන්න නියමිතයි. රජයේ වෙබ් අඩවි විතරක් නෙවෙයි රජයේ ලේඛන පරිවර්තන භාෂා ත්‍රිත්වයෙන්ම තියෙන්න අවශ්‍යයි."

ෂාමින්ද මහලේකම් මහතා පැවැසුවේ මේ ගැටලුවට කඩිනම් විසඳුමක් හැටියට රජයේ සේවයට අලුතින් කරන උපාධිධාරි අනා ඊයාදාගැනීම ඊට ආසන්න විද්‍යුතකි. විදුලිය පාවිච්චි කරන්නන්ගේ සංගමය මේ ගැන සිය දැඩි විරෝධය පළ කර තිබිණි.

"අපේ ජාතික භාෂාව සිංහල. අපේ ගම්වල මිනිස්සු වැඩියෙන් භාවිත කරන්නේ සිංහල හා දමිළ භාෂාව. විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් මේක නොදැන ඉන්න විදිහක් නෑනේ. මේකෙ ඇත්ත කතාව භාෂාව නෙවෙයි. ලංවීම කලින් ඉදිරිපත් කළ දත්ත වැරැදියි. ඒ දත්ත දෝෂය වහගන්න තමයි ඉංග්‍රීසියෙන් හඬපට එවලා නිලධාරීන් හැංගුණේ."

විදුලිය පාවිච්චි කරන්නන්ගේ සංගමයේ ජාතික ලේකම් සංජීව ධම්මික මහතා කරන චෝදනාව අනුව රාජ්‍ය නිලධාරීන් මේ කරන්නේ මිනිසුන්ගේ මූලික අයිතිය වට දෙකකින් උදුරා ගැනීමකි. බොරු දත්ත නිසා හැංගිමුත්තං කරමින් පාරිභෝගිකයාට කොකා පෙන්වන නිලධාරීන් ගැන උපයෝගිතා කොමිසම දැඩි තීරණයක් ගතයුතු බව සංජීව ධම්මික මහතා සඳහන් කරයි. එසේ බලද්දී භාෂාව සිය ප්‍රශ්න වසාගැනීම සඳහා කඩතුරාවක් කරගැනීමක් ද රාජ්‍ය සේවයෙන් දකින්නට ලැබේ.

ලිපිය ආරම්භයේ සටහන් කළ පරිදිම තොරතුරු යනු නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යයකි. එහෙත් ඒ තොරතුරු පරිශීලනය කළ නොහැකි පරිදි ගබඩා කර තිබේ නම් ඉන් පලක් නැත. එය තොරතුරු අපේක්ෂා කරන මහජනයා ආතතියට පත්කරන තත්ත්වයකි. දශක ගණනක් දිග්ගැස්සුණු සිවිල් යුද්ධයක් දක්වා වාර්ගික ආතතීන් හටගන්න මුල් වුණේ ද මේ භාෂා ප්‍රශ්නයයි. ඉතින් එවැනි යුද්ධයක් අවසන්වී දශක ගණනක් යද්දීත් ඊට මුල් වූ හේතු ආමන්ත්‍රණය කර නැත්නම් එය රටක් හැටියට අප මුහුණ දෙන බරපතළ ගැටලුවකි.

■ රවිශාන් ප්‍රනාන්දු
fernandoravishan88@gmail.com